**ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම - 2021/2022**

**1.1 මතය**

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගමේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ, අලාභ හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ඒකක සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයෙහි සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ 2.6 සටහන වෙත අවධානය යොමු කරමි. සමාගම සමාලෝචිත වර්ෂය සඳහා රු. 20,630,743 ක ශුද්ධ අලාභයක් හා සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු.1,373,629,350 ක සමුච්චිත අලාභයක් ලබා ඇති අතර සමාගමේ මුළු වත්කම් රු.11,119,874 ක් ඉක්මවූ මුළු වගකීම් පවතී. | මෙය විශේෂ මහා සභා රැස්වීමේදී (EGM) ආමන්ත්‍රණය කර ඇත. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානය යොමුකල යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර දෙකකට වැඩි කාලයක සිට පැවැත එන නොගෙවූ මුළු ණයගැතියන් රු.68,446,402 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ද ඒවා අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | මෙම ශේෂයන් අයකර ගැනීමට කළමනාකාරීත්වය ඔවුන්ගේ උපරිමයෙන් උත්සාහ කර ඇත. කෙසේ වෙතත්, විවිධ හේතු නිසා එය අසාර්ථක විය. මෙම ශේෂවලින් කිහිපයක් කපා හරින ලෙස කළමනාකාරීත්වය විගණන කමිටුවෙන් ඉල්ලා ඇත. (උදා: පී. එල්. හෙට්ටිආරච්චි, ස්ට්‍රෙච්ලයින් (පුද්) සමාගම, ටෝකියෝ සිමෙන්ති (පුද්) සමාගම, ටිරයිෂෙල් ෆැබ්රික් (පුද්) සමාගම, ලාෆ් පෙට්‍රෝලියම් (පුද්) සමාගම, ලංකා ටයිල් ග්‍රෝට් නිෂ්පාදන (පුද්) සමාගම, හයිඩ්රාමනී මර්කරි ඇපරල් (පුද්) සමාගම, දන්කොටුව පෝසිලේන් (පුද්) සමාගම) කෙසේ වෙතත්, විගණන කමිටුව විසින් කපා හැරීමට අනුමැතිය ලබා දී නොමැත. වෛද්‍ය පර්යේෂණ ආයතනය COVID කාල සීමාව තුළ භාණ්ඩ ලබාගෙන ඇතත් රු මිලියන 6.5 ගෙවීම සඳහා ධනාත්මක ප්‍රතිචාරයක් දක්වා නැත. | ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ආදායම එකතු කරගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය. | ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් (60) ක් ඇතුළත ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ මාස 03 දින 23 ක් ප්‍රමාදවී 2022 සැප්තැම්බර් 23 දින දීය. | මණ්ඩලයේ අනුමැතිය සඳහා වැඩි කාලයක් ගතවීම හේතුවෙන් ප්‍රමාද විය. | රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් කර ඇති කාල රාමුවට අනුව අවසාන ගිණුම් විගණකාධිපති වෙත භාර දිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,630,743 ක අලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.104,329,628 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.83,698,885 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු.66,400,000 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැනෝ පොහොර සංවර්ධන තාක්ෂණය පැවරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් 2012 මාර්තු 15 වන දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ ඇත. ගිවිසුමට අනුව සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 2,250,000 ක් වූ අතර එය වාරික හතරකින් අයකර ගැනීමට නියමිතව පැවතුණි. කෙසේ වෙතත්, ගිවිසුමට අනුව ඇමරිකානු ඩොලර් 1,000,000 ක මුදලක් පමණක් නියමිත වේලාවට නිරවුල් කර ඇති අතර 2013 ජුනි 30 වන දින ඇමරිකානු ඩොලර් 750,000 (රු. 216,562,500)ක අගයකට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය අයකර ගෙන නොතිබුණි. | පෝෂක ද්‍රව්‍ය සෙමෙන් නිදහස් කරන පොහොර අයිතිය නාගර්ජුනා මිලදී ගෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 1.0 ක් ගෙවන ලදී. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් පේටන්ට් බලපත්‍රය මාරු කිරීමත් සමඟ ඔවුන් දෙවන වාරිකය ගෙවීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය අභියෝග හේතුවෙන් සේවාදායකයාට ගෙවිය යුතු මුදල් පියවීමට නොහැකි විය. තවද,අප විසින් අපගේ නමින් ඇති පේටන්ට් බලපත්‍රය නිකුත් කර නොමැති අතර ඉතිරි මුදල නොලැබුණ හොත් අපගේ පේටන්ට් බලපත්‍රයෙන් ඉදිරියේදී මුදල් ඉපැයීමට කටයුතු කරන බවට සඳහන් කරමින් ලිපියක් ද සේවාදායකයා වෙත නිකුත් කර ඇත. | ලැබිය යුතු ආදායම එකතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම විසින් දැනට භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය කළ පිරිවැය රු.671,844,504 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ආයු කාලය නැවත ඇස්තමේන්තු කර නොතිබුණි. | වාර්තා කිරීමේ අරමුණ සඳහා පමණක් වත්කම්වල ඵලදායී ආයු කාලය නැවත ඇස්තමේන්තු කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය අරමුදල් නාස්තියකි. අතිශයින් මිල අධික වන වත්කම්වල ඵලදායී ආයු කාලය නැවත ඇස්තමේන්තු කිරීමට ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගමට විදේශීය විශේෂඥයින්ගෙන් සහාය ලබා ගැනීමට අවශ්‍ය විය හැකිය. තවද, වත්කම්වල ඵලදායී ආයු කාලය නැවත ඇස්තමේන්තු කිරීම සිදු කරන්නේ නම්, එය කළ යුත්තේ වත්කමේ ඵලදායී ආයු කාලය තුළ මිස ඉන් පසුව නොවේ. මෙම සියලු වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති අතර ප්‍රයෝජනවත් ආයු කාලය නැවත ඇස්තමේන්තු කිරීම සහ ඒවා වත්කම් එකතු කිරීම් ලෙස හඳුනා ගැනීම මඟින් නුසුදුසු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමකට මඟපෑදිය හැක. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම් උද්‍යානයේ නවාතැන් ගොඩනැගිල්ලේ වර්ග අඩි 15,315ක් සහ ආපනශාලා ගොඩනැගිල්ලේ වර්ග අඩි 12,676ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී පවා භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පවතින බවට නිරීක්ෂණය විය. | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) සිසුන් හෝ කථිකාචාර්යවරුන් සඳහා නේවාසිකාගාරයක් ලෙස නවාතැන් භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව කළමනාකාරීත්වය ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගමේ යෝජනාව ඇගැයීමට ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) කටයුතු කරමින් සිටී.<br><br>01 වන බදු කරු 2022 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආපනශාලාවේ සිය මෙහෙයුම් ආරම්භ කර ඇත. වෙනත් පාර්ශව ගණනාවක් මෙම පහසුකම නැරඹීමට පැමිණ ඇති අතර ඔවුන්ට ආපනශාලා කුලියට දීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් යෝජනා ලබා දී ඇත. | භාවිතා කළ හැකි වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය. |